# Multicultural Service Officers—MSOs (බහුසංස්කෘතික සේවා නිලධාරීන්)



We speak your language ☎ 13 1202

*Multicultural Service Officers-MSOs* - **Sinhalese**

MSOs සරණාගත සහ සංක්‍රමණික ප්‍රජාවන් සමග Centrelink හි සම්බන්ධතාවය වේ.

## MSOs ගේ සේවා:

- සරණාගත සහ සංක්‍රමණික ප්‍රජාවන් සහ ඔවුන්ගේ ජන කොටස් වලට Centrelink සේවා ප්‍රවර්ධනය කිරීම.
- Centrelink කාර්ය මණ්ඩලයටත් පාරිභෝගිකයන්ටත් පහත සඳහන් දෑ ඇතුළුව බහු සංස්කෘතික සේවා ප්‍රවර්ධනය කිරීම්
  - භාෂණ පරිවර්තන සහ පරිවර්තන සේවා ඇතුළුව;
  - Centrelink Multilingual Call—**13 1202**;
  - පරිවර්තිත තොරතුරු නිපැයුම්.
- පහත අයුරින් සරණාගතයන් සහ සංක්‍රමණිකයන් ඇතුළු diverse cultural and linguistic backgrounds—DCALB (විවිධ සංස්කෘතික සහ භාෂාමය පසුබිම්) වලින් පැමිණි පාරිභෝගිකයන් සමග කටයුතු කිරීමට Centrelink කාර්යමණ්ඩලයට සහය වීම.
  - නිසි පුහුණු කිරීමේ සම්පත් වර්ධනය කිරීම සහ සැපයීම;
  - විදේශීය සුදුසුකම් හඳුනාගැනීම සහ පාරිභෝගිකයින් යෝග්‍ය ආයතනයන් වෙත යොමු කිරීමට සහය වීම.
- අළුතින් පැමිණි සංක්‍රමණිකයන් හා සරණාගතයන් ඇතුළු පාරිභෝගිකයින් සඳහා සංකීර්ණ අවස්ථාවලදී සෘජු පාරිභෝගික සේවා සැලසීමට සහය වීම.
- ප්‍රජාවන් සමග Centrelink සම්බන්ධ කිරීම.

## පහත දෑ සඳහා MSOs ප්‍රජා ආයතනයන් සමග එකට කටයුතු කරයි:

- ජනකොටස් වලින් ලැබෙන ප්‍රතිචාරයන් Centrelink වෙත සැපයීමට.
- ප්‍රජා ආයතනයන් ගේ සහභාගිත්වය ඇතිව තොරතුරු සම්මන්ත්‍රණයන් සංවිධානය කිරීමට.
- පාරිභෝගික තෘප්තිය වර්ධනය කිරීමේ ලා සේවා පරතරයන් හා බාධක හඳුනා ගැනීම.

## තනි පාරිභෝගිකයන්ට MSOs ආධාර වන අයුරු:

- DCALB පාරිභෝගිකයන්ට වඩා හොඳ Centrelink සේවා ලබා ගැනීමට අධාර කිරීම මගින්.
- අදාල Customer Service Officer (පාරිභෝගික සේවා නිලධාරීන්ට) පාරිභෝගිකයා යොමු කිරීම.
- DCALB වෙතින් පැමිණෙන පාරිභෝගිකයන්ට පුළුල් පරාසයක පවතින යෝග්‍ය විකල්පයන් ඉදිරිපත් කිරීම සඳහා අනෙකුත් Centrelink කාර්ය මණ්ඩල සමග කටයුතු කිරීම.

වැඩි විස්තර සඳහා ඔබේ ප්‍රාදේශීය MSO අමතන්න:

## බහුසංස්කෘතික සේවා

Diverse cultural and linguistic backgrounds (DCALB) වෙතින් පැමිණෙන පුද්ගලයින් සඳහා ඔවුනට ලැබෙන ගෙවීම් සහ සේවා පිළිබඳ සියළු තොරතුරු ලැබෙන බවට සහතික වීමට සේවා ගණනාවක් Centrelink සපයයි.

Multicultural Services Community Segment (MSCS) මගින් DCALB පාරිභෝගිකයන් සඳහා පහත දැයෙන් සමන්විත පුළුල් සේවා රැසක් Centrelink වර්ධනය කොට ඇත:

- අපගේ පාරිභෝගිකයන්ට සංස්කෘතික විවිධත්වය පිළිබඳ වැටහීමක් ලබාදෙන ප්‍රජා භාෂා කථා කරන ද්විභාෂා නිපුණත්වයක් ඇති කාර්ය මණ්ඩලය.
- ඉංග්‍රීසි බස හැරුණු විට වෙනත් භාෂා දත් පාරිභෝගිකයන් හා අදහස් හුවමාරු කර ගැනීම සඳහා ආයතනයන් තුල පත්කොට ඇති සහ දුරකථනයෙන් සහය වන නොමිලයේ ලැබෙන භාෂා පරිවර්තකයන්.
- පාරිභෝගකයන්ගේ අනන්‍යතාවය, පදිංචිය සහ ආදායම තහවුරු කිරීම සඳහා Centrelink හට අවශ්‍ය පාරිභෝගික ලියකියවිලි නොමිලයේ පරිවර්තනය කිරීම.
- සෑම මසකම අමතන්නන් 40,000 කට අධික ප්‍රමාණයකට ද්විභාෂා තොරතුරු සහ දුරස්ථ සේවා සපයන Centrelink Multilingual Call Centre (CMC)—**13 1202**.
- සියළුම Centrelink Customer Service Centre වල බහු සංස්කෘතික සේවා සඳහා අධාර වන සහ ප්‍රජාවන් සමග අර්ථවත් ලෙස සම්බන්ධතා වර්ධනය කරන මුළුමහත් ඔස්ට්‍රේලියාව පුරා සේවයේ යොදවා ඇති Multicultural Service Officers (MSOs).
- සියළුම Centrelink ගෙවීම් සහ සේවා ආවරණය කරන පරිවර්තිත සහ මුද්‍රිත තොරතුරු සහිත කුඩා පොත්.
- ප්‍රජා භාෂා 50කටත් වඩා වැඩි ප්‍රමාණයකට පරිවරතනය කරන ලද Centrelink කාරණා පිළිබඳ වැඩිමනත් කරුණු සපයන පරිවර්තිත දත්ත පත්‍රිකා Centrelink වෙබ් අඩවියෙහි ඇත.
- සංක්‍රමණික ජන කොටස් හා සරණාගතයන් නියෝජනය කරන ප්‍රාදේශීය සහ මහපරිමාණයේ ප්‍රජා සංවිධාන හා නිරන්තර සමීප සම්බන්ධතා හා ජාල සම්බන්ධතා පැවැත්වීම.

සිංහල භාෂාවෙන් වැඩිපුර විස්තර සඳහා දුරකථන අංක **13 1202*** අමතන්න. **www.centrelink.gov.au** හි ඇති අන්තර්ජාලය වෙබ් අඩවිය.

** අංක 13 න් පටන් ගන්නා දුරකථන අංක සඳහා ඔස්ට්‍රේලියාව තුල වැය වනුයේ ශත 25කි. 1800 න් පටන් ගන්නා අංක සඳහා මුදල් අය නොකෙරේ. පොදු දුරකථන සහ ජංගම දුරකථන වලින් කෙරෙන ඇමතුම සඳහා වැඩි මුදලක් අයකරනු ඇත.*